# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ

**සුනඛයන් එන්නත් කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම සහ සුනඛයන් වාණිජ අරමුණු සඳහා අභිජනනය කිරීම නියාමනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා ද; සුනඛයන් ලියාපදිංචි කිරීම සඳහා ද; ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව සහ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටු පිහිටුවීම සඳහා ද; (476 වන අධිකාරය වූ) ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ (477 වන අධිකාරය වූ) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින්
2026 සැප්තැම්බර් මස 24 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 සැප්තැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[81 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 130.00　　　　තැපැල් ගාස්තුව: රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ

එල්.ඩී.-ඕ 68/2025

**සුනඛයන් එන්නත් කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම සහ සුනඛයන් වාණිජ අරමුණු සඳහා අභිජනනය කිරීම නියාමනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා ද; සුනඛයන් ලියාපදිංචි කිරීම සඳහා ද; ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව සහ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටු පිහිටුවීම සඳහා ද; (476 වන අධිකාරය වූ) ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ (477 වන අධිකාරය වූ) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක        දරන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීම සහ සුනඛයන් ලියාපදිංචි කිරීම

සුනඛයන් එන්නත් කිරීම සහ ලියාපදිංචි කිරීම

**2.** තම පරිපාලන සීමාවන් තුළ සිටින සෑම සුනඛයකුම වාර්ෂිකව, ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කර තිබෙන බවට සහ අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කර තිබෙන බවට සහතික කිරීම සෑම පළාත් පාලන ආයතනයකම කාර්යය විය යුතුය.

සුනඛයකුගේ අයිතිකරු හෝ සුනඛයා භාරව සිටින තැනැත්තා සුනඛයා එන්නත් කිරීම සහ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු බව

**3.** (අ) වයස සති හයකට වැඩි සුනඛයකුගේ අයිතිකරු හෝ එවැනි සුනඛයකු සිය භාරයේ තබාගන්නා යම් තැනැත්තකු විසින් ඒ සුනඛයා වාර්ෂිකව ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීමට සහ වාර්ෂිකව අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

PL 15954- 342 (2026/09)

(ආ) වීදි සුනඛයකුගේ සුබසාධනය සඳහා වගකීම ගනු ලබන යම් තැනැත්තකු විසින් (අ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයට අනුකූලව කටයුතු කරනු ලැබිය හැකි ය.

එන්නත් කිරීමේ සහතිකය නිකුත් කිරීම

**4**. (1) සුනඛයකු එන්නත් කිරීම පශු වෛද්‍යවරයකු විසින් හෝ පශු වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබිය යුතු ය.

(2) අයිතිකරුවකු සිටින හෝ යම් තැනැත්තකුගේ භාරයේ සිටින සුනඛයකු එන්නත් කිරීමෙන් පසුව, අදාළ පළාත් පාලන ආයතනය, පශු වෛද්‍යවරයකු හෝ තත්කාර්ය සඳහා බලය පවරා ඇති වෙනත් යම් නිලධරයකු විසින් එකී සුනඛයාට අදාළව ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය ආදිය

**5**. (1) 4 වන වගන්තියේ විධිවිධාන යටතේ සුනඛයකු එන්නත් කර එන්නත් කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබීමෙන් පසුව, සුනඛයාගේ අයිතිකරු හෝ සුනඛයා සිය භාරයේ තබාගන්නා තැනැත්තා විසින් එකී සුනඛයා, නියම කරන ලද ගාස්තුවක් ගෙවීමෙන් පසු අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි කළ යුතු ය.

(2) සුනඛයකු ලියාපදිංචි කිරීමෙන් පසුව, පළාත් පාලන ආයතනය විසින් ඒ සුනඛයා සඳහා ලියාපදිංචි අංකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් සුනඛයාගේ අයිතිකරු හෝ සුනඛයා සිය භාරයේ තබාගන්නා තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

අයාලේ යන සුනඛයන් සහ වන සතුන්

**6**. (1) අයිතිකරුවකු හෝ භාරකරුවකු නොමැති වූ අයාලේ යන සුනඛයකු සම්බන්ධයෙන් වන විට දී, පළාත් පාලන ආයතනය විසින් එම සුනඛයා ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කරනු ලැබිය යුතු අතර 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීම අනවශ්‍ය පරිදි සිදුකිරීම වැළැක්වීමේ කාර්යය සඳහා

එකී සුනඛයා පැහැදිලිව හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(2) 16 වන වගන්තියේ සඳහන් කරනු ලබන වන සතකු සම්බන්ධයෙන් වන විට දී, මුඛ ජලභීතිකා එන්නත භාවිත කරනු ලැබිය යුතු ය.

**එන්නත් කිරීමේ සහ ලියාපදිංචි කිරීමේ සහතික සන්තකයේ තබා නොගැනීම**

7. (1) සෑම සුනඛයකුගේ අයිතිකරුවකු ම හෝ සුනඛයකු සිය භාරයේ තබාගන්නා වෙනත් තැනැත්තකු විසින් ම, යම් බලයලත් නිලධරයකු විසින් නියම කරනු ලබන අවස්ථාවක දී, ඒ සුනඛයා සම්බන්ධයෙන් නිකුත් කර ඇති වලංගු එන්නත් කිරීමේ සහතිකය සහ අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) බලයලත් නිලධරයා විසින් ඉදිරිපත් කිරීමට නියම කරනු ලබන අවස්ථාවක යම් සුනඛයකුට අදාළව නිකුත් කර ඇති වලංගු එන්නත් කිරීමේ සහතිකයක් හෝ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් එකී සුනඛයාගේ අයිතිකරු හෝ එකී සුනඛයා සිය භාරයේ තබාගන්නා තැනැත්තා සන්තකයේ නොමැති අවස්ථාවක දී, ඔහු වෙත, බලයලත් නිලධරයා විසින් නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්, එකී සුනඛයා ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කර අදාළ පළාත් පාලන ආයතනයේ එකී සුනඛයාව ලියාපදිංචි කිරීම සඳහා දින දහහතරක කාලසීමාවක් ලබා දිය යුතු ය.

(3) බලයලත් නිලධරයාට පිළිගත හැකි සාධාරණ හේතුවක් මත, (2) වන උපවගන්තිය යටතේ නියම කරන ලද පරිදි දින දහහතරක් ඇතුළත එකී සුනඛයාට අදාළව එන්නත් කිරීමේ සහතිකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීමට එකී උපවගන්තියේ සඳහන් කරන ලද එවැනි යම් අයිතිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, බලයලත් නිලධරයා විසින් ඒ කාලසීමාව තවත් දින දහහතරකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරන ලද්දේ කවර තැනැත්තකු වෙත ද එම තැනැත්තා නිශ්චිතව දක්වන ලද කාලසීමාවන් ඇතුළත සුනඛයා එන්නත් කිරීමට හෝ

ලියාපදිංචි කිරීමට අපොහොසත් වන්නේ නම්, 5 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු ලියාපදිංචි කිරීමේ ගාස්තුවට අමතරව රුපියල් දෙදහසක දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු අතර, පළාත් පාලන ආයතනය විසින් එකී සුනඛයා එන්නත් කර, වහාම 8 වන වගන්තියේ සඳහන් කරනු ලබන සුනඛයන්ගේ රෙජිස්ටරයේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

සුනඛයන්ගේ රෙජිස්ටරය

**8**. මේ පනතේ කාර්ය සඳහා, සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම, ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ සුනඛ ගහනය සම්බන්ධයෙන් වාර්තාවක් තබා ගැනීම පිණිස, “සුනඛයන්ගේ රෙජිස්ටරය” යනුවෙන් හඳුන්වනු ලබන රෙජිස්ටරයක් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

සුනඛයන්ගේ අයිතිය මාරු කිරීම

**9**. (1) සුනඛයකුගේ අයිතිකරු හෝ සුනඛයකු සිය භාරයේ තබාගන්නා තැනැත්තා විසින් විකිණීමෙන් හෝ තෑගි දීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් යම් සුනඛයකු වෙනත් යම් තැනැත්තකු වෙත මාරු කරනු ලබන අවස්ථාවක දී, එකී සුනඛයා එම වර්ෂය සඳහා දැනටමත් ලියාපදිංචි කර ඇත්නම් සුනඛයාගේ නව අයිතිකරු වන එම වෙනත් තැනැත්තා විසින් එකී සුනඛයා එම වර්ෂය සඳහා නැවත ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(2) පෙර අයිතිකරු විසින් එකී විකිණීම හෝ තෑගි දීම සම්බන්ධයෙන් කරන ලද පිටසන් කිරීමක් දරන්නා වූ එකී සුනඛයාට අදාළව දැනටමත් නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකය එකී සුනඛයාගේ නව අයිතිකරු විසින් සිය සන්තකයේ තබා ගත යුතු ය.

## II වන කොටස

### සුනඛ ගහනය පාලනය කිරීම

සුනඛ ගහනය පාලනය කිරීම

**10**. (1) සෑම පළාත් පාලන ආයතනයක්ම ස්වකීය පළාත් පාලන බල ප්‍රදේශය තුළ සිටින අයාලේ යන සියලු සුනඛයන්, අවස්ථාවෝචිත පරිදි, වන්ධ්‍යාකරණය කිරීමට හෝ පුමංගහරණය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, සුනඛයන් වන්ධ්‍යාකරණය කිරීම හෝ පුමංගහරණය කිරීම පශු වෛද්‍යවරයකු විසින් පමණක් සිදු කරනු ලැබිය යුතු ය.

(3) සුනඛයකු වන්ධ්‍යාකරණය කිරීමෙන් හෝ පුමංගහරණය කිරීමෙන් පසුව, පළාත් පාලන ආයතනය විසින්,-

(අ) අනවශ්‍ය ලෙස නැවත අල්ලා ගැනීමෙන් සහ වන්ධ්‍යාකරණය කිරීමෙන් හෝ පුමංගහරණය කිරීමෙන් වැළැක්වීමේ කාර්යය සඳහා එකී සුනඛයාව හඳුනා ගැනීමට;

(ආ) එසේ වන්ධ්‍යාකරණය කරනු ලැබීමෙන් හෝ පුමංගහරණය කරනු ලැබීමෙන් පසුව සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් වන තෙක් ඒ සුනඛයාගේ සෞඛ්‍ය තත්ත්වය වෙත නිසි අවධානය යොමු කර ඒ සුනඛයා රැකබලා ගැනීමට; සහ

(ඇ) යථා තත්ත්වයට පත්වීමෙන් පසුව ඒ සුනඛයාව අල්ලා ගත් ස්ථානයටම මුදා හැරීමට,

අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(4) පළාත් පාලන ආයතනය විසින්, එකී වන්ධ්‍යාකරණය කිරීම හෝ පුමංගහරණය කිරීම සම්බන්ධයෙන් සහ (3) වන උපවගන්තිය යටතේ ගන්නා ලද සියලු පියවර සම්බන්ධයෙන් ලිඛිත වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වන්ධ්‍යාකරණ හෝ පුමංගහරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් පාලන ආයතනය විසින් යම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක සහාය ලබා ගත හැකි ය.

## III වන කොටස

### අභිජනන මධ්‍යස්ථාන විධිමත් කිරීම

අභිජනන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම

**11.** (1) යම් සුනඛ අභිජනන මධ්‍යස්ථානයක් පිහිටා ඇති අදාළ පළාත් පාලන ආයතනය විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කිසිදු තැනැත්තකු විසින් සුනඛයන්ගේ පැටවුන් විකිණීමේ කාර්ය සඳහා එවැනි අභිජනන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

(2) සුනඛයන්ගේ පැටවුන් විකිණීමේ කාර්ය සඳහා යම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ සුනඛ අභිජනන මධ්‍යස්ථානයක් කරගෙන යාමට අදහස් කරන යම් තැනැත්තකු විසින්, එවැනි මධ්‍යස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට, නියමිත ආකෘතියෙන් අදාළ පළාත් පාලන ආයතනය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එම ඉල්ලුම් පත්‍රය නියම කරන ලද විස්තර සහ නියම කරන ලද ගාස්තුව සමග විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, පළාත් පාලන ආයතනය විසින්, යෝජිත අභිජනන මධ්‍යස්ථානයට අදාළව, පශු වෛද්‍යවරයකු හෝ එකී පළාත් පාලන ආයතනය විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයකු විසින් පවත්වනු ලැබිය යුතු පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු ය.

(5) (අ) (4) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් සිදුකරන ලද අවස්ථාවක දී, පශු වෛද්‍යවරයා හෝ තත්කාර්යය සඳහා බලය පවරන ලද නිලධරයා හෝ විසින් එම පරීක්ෂණයට අදාළව පළාත් පාලන ආයතනය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) පළාත් පාලන ආයතනය විසින්, අවස්ථාවෝචිත පරිදි, පශු වෛද්‍යවරයා හෝ තත්කාර්යය සඳහා බලය පවරන ලද නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව සැලකිල්ලට ගැනීමෙන් පසු, ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් ලබාදීම හෝ බලපත්‍රයක් ලබාදීමට ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකි අතර, ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු

ලබන අවස්ථාවක දී, එම තීරණය ගනු ලැබූ දිනයේ සිට දින දහහතරක් පසු නොවන කාලසීමාවක් ඇතුළත, එම ප්‍රතික්ෂේප කිරීම සඳහාවන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබිය යුතු ය.

(6) අභිජනන මධ්‍යස්ථානය සම්බන්ධයෙන්, බලපත්‍රය දරන්නා විසින්,-

(අ) ප්‍රමාණවත් ආහාර, ජලය, නිදා ගැනීම, ව්‍යායාම කිරීමේ පහසුකම්, ආලෝකය, වාතාශ්‍රය, උෂ්ණත්වය, වාසස්ථානය සහ පශු වෛද්‍ය රැකවරණය සහිතව එම මධ්‍යස්ථානයේ සිටින සුනඛයන්ට හිතකර පරිසරයක් සැපයීම සඳහා;

(ආ) රෝග පැතිරීම වැළැක්වීම සහ පාලනය කිරීමට අවශ්‍ය සියලු පූර්වෝපායන් ගැනීම සඳහා;

(ඇ) නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් එම සුනඛයන්ගේ අභිජනනයට සහ අවශ්‍ය රැකවරණයට අදාළ උපදෙස් අනුගමනය කිරීම සඳහා; සහ

(ඈ) ගිනි ගැනීම් සහ ගංවතුර වැනි හදිසි අවස්ථාවල දී සුනඛයන් ආරක්ෂා කිරීම සඳහා,

අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(7) අභිජනන මධ්‍යස්ථානයක සිටින යම් සුනඛයකු මිය ගියවිට, බලපත්‍ර දරන්නා විසින් එම මරණය පිළිබඳව අදාළ පලාත් පාලන ආයතනය වෙත වහාම දැනුම් දිය යුතු ය.

(8) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් බලපත්‍ර දරන්නකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කිරීමෙන් අනතුරුව, රුපියල් දසදහස නොඉක්මවන දඩයකට හෝ මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වන සිර දඬුවමකට හෝ එම දඩය සහ සිර දඬුවම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

පරිශ්‍රය පරීක්ෂා කිරීම

**12**. (1) (අ) සුනඛයන්ට සංස්පර්ශක රෝග ආසාදනය වීම වැළැක්වීමේ කාර්ය සඳහා, පළාත් පාලන ආයතනයක් විසින්, එහි පරිපාලන සීමාවන් ඇතුළත පිහිටි යම් අභිජනන මධ්‍යස්ථානයක පරිශ්‍රයක් පරීක්ෂා කිරීම සඳහා යම් පශු වෛද්‍යවරයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට ලිඛිතව බලය ලබා දිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වන ලද කාර්ය සඳහා, මේ වගන්තිය යටතේ බලය ලැබී ඇති යම් තැනැත්තකු විසින්, අවශ්‍ය වන්නේ නම් බලය ලබාදීමේ ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසුව, දවසේ සියලු සාධාරණ වේලාවන්හි දී එවැනි යම් පරිශ්‍රයකට ඇතුළු වී එකී පරිශ්‍රය සහ යම් සුනඛයන් හෝ එහි දී සොයා ගනු ලබන යම් දෙයක් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා ‘‘පරිශ්‍රය’’ යන්නට ‘‘වාසය කරන ස්ථානයක්’’ ද ඇතුළත් වේ.

බලපත්‍රයක් අලුත් කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම

**13**. (1) 11 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන බලපත්‍රයක් නිකුත් කරන දින සිට මාස දොළහක කාලසීමාවක් සඳහා වලංගුවන අතර තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, වරකට තවදුරටත් වූ මාස දොළහක කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(2) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය නියමිත ආකෘතියෙන් විය යුතු අතර නියමිත ගාස්තුව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රයක් දරන්නා විසින් එකී බලපත්‍රය අලුත් කිරීම සඳහා එහි කල් ඉකුත්වීමේ දිනයට මාසයකට පෙරාතුව ඉල්ලුම් නොකරන අවස්ථාවක දී, එහි කල් ඉකුත්වීමේ දිනයෙන් පසු බලපත්‍රය අවලංගු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් බලපත්‍රයක් දරන්නකු බලපත්‍රයේ යම් කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇත්නම් හෝ ඔහු විසින් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇත්නම්, පළාත් පාලන ආයතනය විසින් එකී බලපත්‍රය දරන්නා වෙත නිකුත්කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු වෙත නිකුත්කර ඇති බලපත්‍රයක් (4) වන උපවගන්තිය යටතේ අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී තැනැත්තා, එකී බලපත්‍රය අවලංගු කරන ලද දින සිට අවුරුදු දෙකක් ඉකුත්වීමට පෙර අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට නුසුදුසු වන්නේ ය.

අභියාචනා

**14**. (1) බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් මගින් හෝ බලපත්‍රයක් අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, එකී ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව එකී තැනැත්තා වෙත දැනුම් දෙමින් ලිඛිත සන්නිවේදනයක් ලැබූ දින සිට දින තිහක් ඇතුළත, එකී තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් වන තීරණය, එකී අභියාචනය ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත ගනු ලැබිය යුතු අතර එකී තීරණය ගනු ලැබූ දින සිට දින හතක් ඇතුළත එකී අභියාචනය කරන ලද තැනැත්තා වෙත එම තීරණය පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ජලභීතිකා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම

පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන දැන්වීමක් මත සුනඛයන් රඳවා තබා ගැනීම

**15**. (1) මේ පනතේ කිසිදු විධිවිධානයක් නොතකා, යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් ඇතුළත ජලභීතිකා රෝගය පවතින අවස්ථාවක දී හෝ ජලභීතිකා රෝග අවදානමක් පවතින අවස්ථාවක දී, එකී පළාත් පාලන ආයතනය විසින්, ප්‍රසිද්ධ ස්ථානවල ඇලවිය යුතු ලිඛිත දැන්වීමක් මගින් හෝ ප්‍රදේශය තුළ පුළුල් ලෙස ප්‍රචාරය කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින්, අවස්ථාවෝචිත පරිදි, ගම්මාන එකක් හෝ වැඩි ගණනක් ඇතුළුව එහි සීමාවන් තුළ සමන්විත වන සම්පූර්ණ ප්‍රදේශය හෝ එහි යම් කොටසක්, ජලභීතිකා රෝගය පවතින හෝ ජලභීතිකා රෝග අවදානමක් පවතින ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) එකී පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාවන් ඇතුළත යම් පොදු ස්ථානයක හෝ මාර්ගයක හෝ ඒ සීමාවන් ඇතුළත පිහිටි පුද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක් හෝ ගෙවත්තක් නොවන යම් ස්ථානයක සිටිය දී සොයාගනු ලබන බැඳ දමා නොමැති හෝ මෙහෙයවීමකින් තොර යම් සුනඛයකු, ජලභීතිකා රෝගය අසාදනය වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, 12 වන වගන්තිය යටතේ බලය ලබා දී ඇති නිලධරයකුගේ නිරීක්ෂණය සඳහා රඳවා තබා ගනු ලැබීමට යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, පළාත් පාලන ආයතනය විසින්, එකී පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාවන් ඇතුළත සුදුසු රඳවා ගැනීමේ මධ්‍යස්ථාන සහ නිරීක්ෂණ මැදිරි සපයා දී පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) (අ) (2) වන උපවගන්තිය යටතේ එවැනි යම් සුනඛයකු රඳවා තබා ගැනීමෙන් පසුව, එම ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා විසින්, සුනඛයාට ජලභීතිකා රෝගය ආසාදනය වී තිබේ ද යන්න නිශ්චිතව සහතික කර ගැනීම සඳහා, ක්‍රමවත් කාල අන්තර වලදී රඳවා ගැනීමේ මධ්‍යස්ථානයට පැමිණ පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(ආ) අදාළ ප්‍රදේශය සඳහා පත්කරනු ලබන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරයාට එම රඳවාගැනීමේ මධ්‍යස්ථානයට ගොස් සුනඛයා නිරීක්ෂණය කිරීම සඳහා හිමිකමක් තිබිය යුතු ය.

(5) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරයා විමසා, එම සුනඛයාට ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බව (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ක්‍රියා කරන රජයේ පශු වෛද්‍යවරයාගේ මතය වන්නේ නම්, එකී රජයේ පශු වෛද්‍යවරයා හෝ එකී පශු වෛද්‍යවරයා විසින් බලය ලබා දී ඇති වෙනත් යම් පශු වෛද්‍යවරයකු විසින්, මහජනතාවට වහාම සිදු විය හැකි අනතුර වැළැක්වීම පිණිස එකී සුනඛයා නිර්වින්දන මරණයට පත් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධාන මේ වගන්තියේ කාර්ය සඳහා හඳුනාගනු ලබන ඕනෑම රඳවා ගැනීමේ ස්ථානයකට අදාළ විය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ රඳවා තබා ගන්නා ලද සුනඛයකු, ජලභීතිකා රෝගය ආසාදනය වී නොමැති බවට හඳුනාගනු ලැබූ විටක, එම සුනඛයා ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කර සහ වන්ධ්‍යාකරණයට හෝ පුමංගහරණයට ලක්කර එකී සුනඛයා අල්ලාගත් ස්ථානයටම නැවත මුදා හරිනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් දැන්වීමක්, (1) වන උපවගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව ක්‍රියාත්මක විය යුතු අතර එය අවම වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන එක් පුවත්පතක හෝ පළ කරනු ලැබිය යුතු ය.

ආසාදිත බවට හඳුනාගනු ලබන හෝ සැක කරනු ලබන පශු සම්පත් සඳහා ඇති කරන සතුන් හෝ වන සතුන්

**16**. යම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ යම් පශු සම්පත් සඳහා ඇති කරන සතකුට හෝ වන සතකුට ජලභීතිකා රෝගය අසාදනය වී ඇති බවට හඳුනාගනු ලබන අවස්ථාවක දී, අදාළ ප්‍රදේශයේ වෙනත් සතුන්ට ජලභීතිකා රෝගය ව්‍යාප්ත වීම නතර කිරීම සඳහා අවශ්‍ය පාලන පියවර හෝ ආරක්ෂාකාරී පියවර ගැනීමේ කාර්ය සඳහා -

(අ) පශු සම්පත් සඳහා ඇති කරන සතකු සම්බන්ධයෙන් වන විට දී, අධ්‍යක්ෂවරයා හෝ අදාළ ප්‍රදේශය සඳහා පත් කරන ලද රජයේ පශු වෛද්‍යවරයා;

(ආ) වන සතකු සම්බන්ධයෙන් වන විට දී, අධ්‍යක්ෂවරයා හෝ අදාළ ප්‍රදේශය සඳහා පත් කරන ලද රජයේ පශු වෛද්‍යවරයා හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනජීවී සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා හෝ අදාළ ප්‍රදේශය සඳහා පත් කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරයා සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා,

ඒ පිළිබඳව වහාම දැනුම්වත් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව

**17**. (1) (මෙහි මින් මතු “ජාතික කමිටුව” යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:-

(අ) නිල බලයෙන් පත් වූ පහත දැක්වෙන සාමාජිකයන්, එනම් -

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(ii) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) සත්ත්ව සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා;

(v) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(vi) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකු;

(vii) මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අධ්‍යක්ෂවරයා;

(viii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥවරයා;

(ix) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වෛරස විද්‍යාඥයකු;

(x) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා;

(xi) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ මත සත්ත්ව සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෛරස විද්‍යාඥයකු;

(xii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(xiii) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන නියෝජිතයන් දෙදෙනකු;

(xiv) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥයා;

(xv) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය විශේෂඥවරයකු;

(xvi) පළාත් පාලන විෂයය පවරා ඇති අදාළ පළාත් අමාත්‍යවරයා විමසා, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකු;

(xvii) පළාත් පාලන විෂයය පවරා ඇති අදාළ පළාත් අමාත්‍යවරයා විමසා, එක් එක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා විසින් නම් කළ තැනැත්තකු;

(xviii) පොලිස්පතිවරයා විසින් නම් කරනු ලබන නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(xix) 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාව විසින් නම් කරනු ලබන පශු වෛද්‍යවරයකු; සහ

(ආ) (මෙහි මින් මතු “පත් කළ සාමාජිකයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි කරනු ලබන සත්ත්ව සුබසාධන සංවිධාන නියෝජනය කරනු ලබන, සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු.

(2) (අ) අමාත්‍යවරයා විසින් ජාතික කමිටුවේ යම් සාමාජිකයකු එකී කමිටුවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) ජාතික කමිටුවේ නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයකු විසින් ම ඔහු එකී කමිටුවේ සාමාජිකයකු වශයෙන් පත් වූ නිලය දරන තාක් එම ධුරය දැරිය යුතු ය.

(3) ජාතික කමිටුව විසින් එහි සාමාජිකත්වයේ පවතින යම් පුරප්පාඩු නොතකා එහි කර්තව්‍ය ඉටු කළ යුතු ය.

(4) ජාතික කමිටුවේ යම් රැස්වීමක සණ පූරණය සාමාජිකයන් හත් දෙනෙකු විය යුතු ය.

(5) ජාතික කමිටුව අවම වශයෙන් සෑම මාස දෙකකටම වරක් රැස්විය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ජාතික කමිටුව විසින් එහි රැස්වීම් සහ එකී රැස්වීම්වල කටයුතුවලට අදාළව ස්වකීය කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

**18**. ජාතික කමිටුවේ සාමාජිකයන්ට ජාතික කමිටුවේ සිටීම වෙනුවෙන්, ජාතික කමිටුවේ රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් දෙනු ලබන ප්‍රසාද දීමනාව හැර, කිසිදු පාරිශ්‍රමිකයක් නොලැබිය යුතු ය.

ජාතික කමිටුවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**19**. ජාතික කමිටුවේ කර්තව්‍ය වන්නේ -

ජාතික කමිටුවේ කර්තව්‍ය

(අ) මේ පනත පරිපාලනය කිරීමේ දී හටගන්නා කාරණා සම්බන්ධයෙන් පළාත් පාලන විෂයය පවරා ඇති අදාළ අමාත්‍යවරුන්ට සහ පළාත් අමාත්‍යවරුන්ට සහ වෙනත් සම්බන්ධිත ආයතනවලට උපදෙස් ලබා දීම;

(ආ) මේ පනත යටතේ පවරා ඇති බලතල සහ කර්තව්‍ය පැවරී ඇති අධිකාරීන් විසින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම;

(ඇ) ජලභීතිකා රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් මහජන දැනුම්වත්භාවය ඇති කිරීම;

(ඈ) ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා සහයෝගීතාව සහ අරමුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම;

(ඉ) ජලභීතිකා රෝගය තුරන් කිරීම සහ මුලිනුපුටා දැමීම සහ එන්නත්වල වැඩිදියුණු කිරීම් සහ පිරිවැයට අනුව ඵලදායී එන්නත් කිරීමේ ක්‍රමවල සංවර්ධනය යන ක්ෂේත්‍රවල ජාතික සහ ජාත්‍යන්තර සංවර්ධනයන් නිරීක්ෂණය කිරීම මගින් ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඊ) මේ පනතේ II වන කොටසේ විධිවිධානවලට අනුකූලව රටේ සුනඛ ගහනය පාලනය කිරීම සඳහා පියවර ගැනීම;

(ඇ) සෑම අවුරුදු පහකට වරක්ම සුනඛ සංගණනයක් පැවැත්වීම; සහ

(ඈ) ජාතික කමිටුවේ කර්තව්‍ය ඵලදායීව ඉටු කිරීම සඳහා පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමෙන් උප කමිටු පත් කිරීම.

## VI වන කොටස

### ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටුව

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටුව

**20.** (1) එක් එක් පළාත් පාලන ප්‍රදේශය සඳහා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "ප්‍රාදේශීය කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:-

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් එනම් -

(i) ප්‍රාදේශීය කමිටුවේ සභාපතිවරයා විය යුතු අදාළ පළාත් පාලන අයතනයේ සභාපතිවරයා;

(ii) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iii) අදාළ ප්‍රදේශය සඳහා පත් කරන ලද අදාළ පළාත් පාලන ආයතනයේ සහකාර කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iv) අදාළ පළාත් පාලන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා;

(v) අදාළ පළාත් පාලන ආයතනයේ රජයේ පශු වෛද්‍යවරයා;

(vi) අදාළ පළාත් පාලන ආයතන සීමාව තුළ කාර්ය පැවරී ඇති නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(vii) අදාළ පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා; සහ

(ආ) පළාත් පාලන අයතනයේ සභාපතිවරයා විසින්, සත්ත්ව සුබසාධන කටයුතුවල නිරත සංවිධානයක සාමාජිකයකු ඇතුළත්ව මහජනතාව අතරින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු.

(2) ප්‍රාදේශීය කමිටුවේ රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය.

(3) පත් කරන ලද නිලධරයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

ප්‍රාදේශීය කමිටුවේ කර්තව්‍ය

**21**. ප්‍රාදේශීය කමිටුවේ කර්තව්‍ය වනුයේ -

(අ) II වන කොටසේ විධිවිධාන අනුව අදාළ පළාත් පාලන ප්‍රදේශය තුළ සුනඛ ගහනය පාලනය කිරීම සඳහා පියවර ගැනීම;

(ආ) ජලභීතිකා රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් මහජන දැනුම්වත්භාවය ඇති කිරීම; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව අදාළ පළාත් පාලන ප්‍රදේශය තුළ ජලභීතිකා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා සහ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා පියවර ගැනීම.

## VII වන කොටස

### සාමාන්‍ය

බලයලත් නිලධරයන්

**22**. මේ පනතේ කාර්ය සඳහා -

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා තමා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස, අවස්ථාවෝචිත පරිදි, මහනගර සභාවේ

නගරාධිපතිවරයා, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව යථා පරිදි බලය ලබා දී ඇති පශු වෛද්‍යවරයකු හෝ වෙනත් යම් නිලධරයකු;

(ආ) පොලිස් නිලධරයකු; සහ

(ඇ) සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු,

බලයලත් නිලධරයකු විය යුතු ය.

බලයලත් නිලධරයාගේ බලතල

**23**. (1) යම් බලයලත් නිලධරයකුට, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් උල්ලංඝනය වී ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, ඔහු විසින් -

(අ) ජලභීතිකා රෝගය ආසාදනය වූ යම් සුනඛයකු, ලියාපදිංචි නොකළ සුනඛයකු හෝ ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කර නොමැති සුනඛයකු තබාගෙන සිටින බවට ඔහු විශ්වාස කරන යම් ස්ථානයකට දවසේ ඕනෑම සාධාරණ වේලාවක දී ඇතුළු වීම;

(ආ) එම පරිශ්‍රයේ සිටින යම් සුනඛයකු පරීක්ෂා කිරීම;

(ඇ) (අ) ඡේදයේ සඳහන් කරන ලද එවැනි යම් සුනඛයකු අවශ්‍ය විය හැකි යම් කාලයක් තහනමට ගෙන රඳවා තබා ගැනීම;

(ඈ) පරිශ්‍රය සහ ඔහුගේ මතය අනුව, මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් අනාවරණය කර ගැනීමට උපකාරී විය හැකි ලේඛනයක් ඇතුළුව පරිශ්‍රය තුළ ඇති යම් දෙයක් පරීක්ෂා කිරීම;

(ඉ) ඵලදායී සෝදිසි මෙහෙයුමක් කරගෙන යාමේ කාර්යය සඳහා, ජලභීතිකා රෝගය ආසාදිත යම් සුනඛයකු ගෙන යනු ලබන යම් වාහනයක් නැවැත්වීම හෝ රඳවා තබා ගැනීම, ඒ වාහනය සෝදිසි කිරීම සහ එවැනි යම් සුනඛයකු පරීක්ෂා කිරීම;

(ඊ) ඔහුගේ මතය අනුව මේ පනතේ යම් විධිවිධාන උල්ලංඝනය කිරීමක් අනාවරණය කර ගැනීමට උපකාරී විය හැකි වන, පරිශ්‍රය තුළ හෝ පරිශ්‍රයෙන් සොයා ගනු ලබන යම් ලේඛනයක පිටපත් හෝ උද්ධෘතයන් ලබා ගැනීම;

(උ) පරිශ්‍රයේ හෝ පරිශ්‍රය තුළ සිටින යම් සුනඛයකුගේ ඡායාරූප ගැනීම, චිත්‍රපට හෝ වීඩියෝ පට සකස් කිරීම;

(ඌ) පනත යටතේ වූ වරදක් සමඟ සම්බන්ධ වන බවට බලයලත් නිලධරයා විසින් සාධාරණ හේතූන් මත විශ්වාස කරන යම් සුනඛයකු හෝ ලේඛනයක් ඇතුළුව යම් දෙයක් තහනමට ගැනීම;

(එ) බලයලත් නිලධරයාට මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන යම් සහායක් එකී නිලධරයාට ලබා දෙන ලෙස පරිශ්‍රය තුළ සිටින යම් තැනැත්තකුට නියම කිරීම;

(ඒ) පශු වෛද්‍යවරයකුගේ සහාය ඇතිව පරිශ්‍රය තුළ හමුවන යම් සුනඛයකුගෙන් පටක, රුධිර, මූත්‍රා හෝ වෙනත් ශාරීරික ද්‍රව්‍ය නියැදියක් ලබා ගැනීම; සහ

(ඔ) එය සාධාරණ යයි බලයලත් නිලධරයා සලකනු ලබන්නේ නම්, මේ පනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකියාව ලබා දෙන යම් කාරණයක් පිළිබඳව පරිශ්‍රය තුළ සිටින යම් තැනැත්තකුගෙන් විමසීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ක්‍රියා කරන බලයලත් නිලධරයකු විසින්, එසේ අවශ්‍ය කරනු ලැබුවේ නම්, ඔහුගේ අධිකාරය සහිත ලේඛන ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියට අනුව යම් බලයලත් නිලධරයකු ඇතුළු වන්නා වූ පරිශ්‍රයක අයිතිකරු හෝ ඒ පරිශ්‍රය භාර තැනැත්තා සහ එහි සිටින සෑම තැනැත්තකු විසින්ම, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සාධාරණ සහාය බලයලත් නිලධරයාට ලබා දිය යුතු අතර, එසේ අවශ්‍ය විය හැකි යම් තොරතුරු ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නියෝග

**24**. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනත මගින් නියම කර ඇති හෝ නියෝග සාදනු ලැබිය යුතු යයි මේ පනත මගින් බලය ලබා දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන කාරණාවලින් යම් කාරණයක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) පළාත් පාලන ආයතන විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි, යම් නිදහස් කිරීම් තිබේ නම් ඒවා සහිතව, යම් පොදු පාරක හෝ ස්ථානයක සිටින විට දී සුනඛයන්ගේ කට වසා බැඳීම;

(ආ) සුනඛයන්ගේ අයිතිකරු හෝ සිය භාරයේ තබාගන්නා තැනැත්තා විසින් සුනඛයන් සිය පාලනය යටතේ තබාගැනීම;

(ඇ) පාලනය යටතේ තබා නොගන්නා සුනඛයන් තහනමට ගැනීම සහ රඳවා තබා ගැනීම;

(ඈ) අල්ලා ගත් සහ රඳවා තබා ගත් යම් සුනඛයකු රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් දරන ලද වියදම් පළාත් පාලන ආයතනය විසින්, සුනඛයා අයිතිකරුගෙන් හෝ සුනඛයා තම භාරයේ තබා ගන්නා තැනැත්තාගෙන් අය කර ගැනීම;

(ඉ) සුනඛ සංදර්ශන හෝ ප්‍රදර්ශන පැවැත්වීම සහ ප්‍රදර්ශන සඳහා හෝ එහි දී විකිණීම සඳහා සුනඛයන් තැබීම නියාමනය කිරීම;

(ඊ) සුනඛයන් එන්නත් කිරීම හෝ පරීක්ෂණ සිදු කිරීම සඳහා වන එන්නත් කිරීමේ මධ්‍යස්ථාන වශයෙන් යම් පළාත් පාලන ප්‍රදේශයක් තුළ මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒ මධ්‍යස්ථාන නියාමනය කිරීම සහ පාලනය කිරීම;

(ඩ) ජලභීතිකා රෝගය පවතින බව හඳුනා ගැනීම සඳහා සුනඛයන් හෝ සැක සහිත සත්ත්වයන් සම්බන්ධයෙන් අනිවාර්යයෙන් පරීක්ෂණ සිදු කිරීම;

(ඪ) සුනඛයන්ගේ පරීක්ෂණ සිදු කිරීම හෝ එන්නත් කිරීම සම්බන්ධ ගාස්තු පැනවීම සහ අයකර ගැනීම;

(එ) වන්ධ්‍යාකරණය හෝ පුමංගහරණය මගින් අධික සුනඛ ගහනය පාලනය කිරීම;

(ඒ) ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් පැවැත්වීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය;

(ඔ) සුනඛයන් ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ අලුත් කිරීම සඳහා අයකර ගනු ලැබිය යුතු ගාස්තු;

(ඕ) අභිජනන මධ්‍යස්ථානවල සුනඛයන් විකිණීමට අදාළ කොන්දේසි;

(ක) සුනඛයන් අභිජනනය සඳහා වූ ප්‍රමිතීන්ට අදාළ කොන්දේසි; සහ

(ග) ජලභීතිකා රෝගය ආසාදිත සුනඛයන් නිරෝධායනය කිරීමට අදාළ කොන්දේසි.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන යම් පසු දිනයක දී ක්‍රියාත්මකභාවයට පත් විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් එකී අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වැරදි

**25**. (1) පොදු ස්ථානයක සුනඛයකු අතහැර දමා යන යම් සුනඛයකුගේ අයිතිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) ජලභීතිකා රෝගය ආසාදනය වූ හෝ ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට සැක සහිත හෝ ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට සාධාරණ ලෙස සැක සහිත සුනඛයකු විසින් සපා කෑමට ලක්ව ඇති සුනඛයකු ඒ බව දැන දැනම තම සන්තකයේ තබාගෙන සිටින එකී සුනඛයාගේ අයිතිකරු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඒ පිළිබඳ දැන්වීමක් පළාත් පාලන ආයතනය වෙත ලබාදිය යුතු අතර, එසේ ලබා දීමට අපොහොසත් වන්නේ නම්, ඔහු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති සුනඛයකු පිළිබඳ දැන්වීමක් ලැබෙන සෑම පළාත් පාලන ආයතනයක් ම මේ පනතේ විධිවිධාන යටතේ එය වෙත පනවා ඇති යම් කාර්යයක් ඉටු කිරීමට අපොහොසත් වන්නේ නම්, එය මේ පනත යටතේ වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට එය යටත් විය යුතු ය.

(4) ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති හෝ ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට සැක සහිත සුනඛයකු, ඒ සුනඛයාට ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බව හෝ

ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට සැක සහිත බව හෝ ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති සුනඛයකුගෙන් සපා කෑමට ලක්විය හැකි බව හෝ දැන දැනම නිදැල්ලේ යාමට ඉඩ හරින එවැනි යම් සුනඛයකුගේ අයිතිකරුවකු හෝ එවැනි සුනඛයකු භාරව සිටින තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

(5) (අ) සුනඛයකු නීත්‍යානුකූලව තහනමට ගෙන ඇති වෙනත් යම් තැනැත්තකුගේ භාරයෙන් එම සුනඛයා ඉවත් කරන; හෝ

(ආ) සුනඛයකු නීත්‍යානුකූලව තහනමට ගන්නා වූ, රඳවා තබා ගන්නා වූ හෝ විනාශ කරන්නා වූ වෙනත් යම් තැනැත්තකුට යම් ආකාරයකින් හිරිහැර කරන, බාධා කරන හෝ එවැනි තැනැත්තකු ඉන් වළක්වන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

පශු වෛද්‍යවරයකුගේ කාර්යය

**26**. සෑම පශු වෛද්‍යවරයකු විසින් ම -

(අ) නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින්, යම් අදාළ ප්‍රදේශයක හෝ දිස්ත්‍රික්කයක එන්නත් කරන ලද සුනඛයන් පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට පියවර ගනු ලැබිය යුතු ය; සහ

(ආ) යම් අදාළ ප්‍රදේශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ හඳුනාගත් ජලභීතිකා රෝගයේ තත්ත්වය ක්‍රමවත් පදනමකින් සහ අවම වශයෙන් සෑම මසකට එක් වරක්වත් අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ කාර්යය

**27**. සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු විසින් ම, සුනඛයන් සපා කෑමේ සිද්ධීන්ට අදාළව සිදු වූ ස්ථානය, දිනය සහ වේලාව ඇතුළුව එම සිද්ධීන්ට අදාළ තොරතුරු අදාළ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

අයිතිකරුවකුගේ වගකීම

**28**. යම් සුනඛයකුගේ අයිතිකරු එම සුනඛයා විසින් යම් තැනැත්තකු හෝ සතකු ආක්‍රමණය කර සිදු කරනු ලබන හානිවලට සහ එයින් ඇතිවන තුවාලවලට වගකිව යුතු ය.

සහතිකය තීරණාත්මක සාක්ෂියක් වන අවස්ථාව

**29**. යම් සුනඛයකුට ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට හෝ ආසාදනය වී තිබූ බවට නිශ්චිතව දක්වමින් නිකුත් කරනු ලබන පශු වෛද්‍යවරයකුගේ සහතිකයක්, මේ පනතේ කාර්ය සඳහා, අධිකරණයක දී එකී කරුණ සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

පනත යටතේ වන වැරදි සංඥෙය වැරදි විය යුතු බව

**30**. මේ පනත යටතේ වන සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා සංඥෙය වැරදි ලෙස සලකනු ලැබිය යුතු ය.

වරදකරු කරනු ලැබීමෙන් පසු රාජසන්තක කිරීම සහ වියදම් ප්‍රතිපූරණය කිරීම

**31**. (1) මේ පනත යටතේ වන වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමෙන් පසුව, මහෙස්ත්‍රාත්වරයා විසින්, පනවනු ලැබිය හැකි යම් දඬුවමකට අමතරව,-

(අ) වරද සිදු කරනු ලැබුවේ යම් සුනඛයකු සම්බන්ධව ද ඒ සුනඛයා රාජසන්තක කිරීම;

(ආ) වරද සිදු කිරීමේ දී භාවිත කරන ලද යම් ආයුධ, උපකරණ හෝ වාහන රාජසන්තක කිරීම; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව යම් සුනඛයකු තබන ලද්දේ යම් තැනැත්තකු හෝ ආයතනයක් භාරයේ ද ඒ තැනැත්තාට හෝ ආයතනයට උපචිත වූ වියදම් ප්‍රතිපූරණය කිරීම,

සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආඥාවක් කිරීමේ දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, සුනඛයා රැකබලා ගැනීම සහ සුනඛයාගේ භාරය සුදුසු තැනැත්තකුට හෝ (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයක් හෝ වෙනත් සුදුසු ආයතනයක් වෙත, එකී තැනැත්තාගේ හෝ එකී මධ්‍යස්ථානය හෝ එකී ආයතනය භාර තැනැත්තාගේ කැමැත්ත ඇතිව, දෙනු ලැබිය යුතු බවට විධාන කළ හැකි ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් සත්ත්ව සුබසාධනය උදෙසා වන අවශ්‍යතා සපුරාලන ස්ථානයක් වශයෙන් නම් කරනු ලැබිය හැකි ය.

මහෙස්ත්‍රාත් වරයාගේ ආඥාවක් යටතේ සුනඛයන් රැකවරණයක් යටතේ තබා ගැනීම

**32**. මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කරනු ලබන බවට හෝ සිදු කරනු ලැබීමට ඉඩ ඇති බවට කියාපානු ලබන්නේ යම් සුනඛයකු සම්බන්ධයෙන් ද, එකී සුනඛයා සම්බන්ධව යම් වරදක් අඛණ්ඩව සිදු වීම වැළැක්වීම සඳහා හෝ එකී සුනඛයාට අවශ්‍ය රැකවරණය සහ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ කාර්ය සඳහා, එකී සුනඛයා තම භාරයට ගැනීමට කැමැත්තක් දක්වන සුදුසු තැනැත්තකුගේ, රජයේ ගොවිපළක, සතුන් රැකබලා ගන්නා ස්ථානයක හෝ වෙනත් සුදුසු ආයතනයක රැකවරණය සහ භාරය යටතේ එකී සුනඛයාව තැබීමට අවශ්‍ය බවට, පොලිස් නිලධරයකු විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත හෝ ස්වකීය මෙහෙයවීමෙන්, මහෙස්ත්‍රාත්වරයකු සෑහීමකට පත් වීමෙන් පසුව, එම මහෙස්ත්‍රාත්වරයා විසින්, එසේ කළ යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

සුනඛයන් නිරෝධායනය කිරීම

**33**. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම සුනඛයකුම, 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත යටතේ නියම කර ඇති පරිදි යම් ස්ථානයක දී යම් තැනැත්තන් විසින් කලින් කලට සුනඛයාව ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට නියම කරනු ලබන්නේ නම් මිස, දින තිහක අවම කාලසීමාවක් සඳහා එකී සුනඛයා නිරෝධායනයට යටත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) නිරෝධායනය යටතේ තැබීමට නියම කරනු ලබන යම් සුනඛයකු සඳහා ප්‍රමාණවත් ආහාර සහ ජලය සැපයීම; සහ

(ආ) නිරෝධායනය යටතේ තබා ඇති සෑම සුනඛයකුගේම ප්‍රතිකාර සහ නඩත්තුව සඳහා සහ නිරෝධායනය අතරතුර මරණයට පත්විය හැකි යම් සුනඛයකුගේ මළකුණ බැහැර කිරීමේ දී දරනු ලබන සියලු වියදම් දැරීම,

සුනඛයකුගේ ආනයනකරුගේ කාර්ය විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සෑම ආනයනකරුවකු ම විසින්, 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත යටතේ නියම කරනු ලබන පරිදි යම් මුදලක නිරෝධායන ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

(4) නිරෝධායනයට යටත්ව සිටින යම් සුනඛයකුට ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බව සොයා ගනු ලැබූ විට අදාළ පලාත් පාලන ආයතන ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය නිලධරයා හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය දෙනු ලබන වෙනත් පශු වෛද්‍ය නිලධරයකු විසින් ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බව සොයා ගනු ලැබූ සුනඛයා නිර්වින්දන මරණයට පත්කිරීම සහ එකී සුනඛයාගේ මළකුණ බැහැර කිරීම සඳහා නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම

**34**. (1) (476 වන අධිකාරය වූ) ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ (477 වන අධිකාරය වූ) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (මෙහි මින් මතු "ඉවත් කළ පනත්" යනුවෙන් සඳහන් කරනු ලබන) (476 වන අධිකාරය වූ) ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ (477 වන අධිකාරය වූ) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඉවත් කිරීම නොතකා,-

(අ) ඉවත් කළ පනත් යටතේ ඇතුළත්ව තිබුණා වූ සහ (මෙහි මින් මතු "ක්‍රියාත්මක වන දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත ක්‍රියාත්මකභාවයට පත් වන දිනයට පෙරාතුවම වූ දිනයේ පැවතියා වූ යම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක්, ක්‍රියාත්මක වන දිනයේ සිට මේ පනත යටතේ ඇතුළත් වූ කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් වන අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) ඉවත් කළ පනත යටතේ යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක් ඉදිරියේ පවරනු ලැබ ඇති සහ ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඒ අධිකරණයේ හෝ විනිශ්චය සභාවේ විභාග වෙමින් පවතින යම් සිවිල් නඩු කටයුත්තක්, අපරාධ නඩු කටයුත්තක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුතු, ක්‍රියාත්මක වන දින සිට මේ පනත යටතේ පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය;

(ඇ) ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වන දිනයේ දී ඉවත් කළ පනත් යටතේ නිසි අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් එළඹෙන ලද හෝ සිදු කරන ලද යම් තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ තීන්දුවක්, ක්‍රියාත්මක වන දින සිට මේ පනත යටතේ සිදු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ඈ) ඉවත් කළ පනත් යටතේ සාදන ලද ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සහ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන යම් නියෝගයක් හෝ රීතියක්, ක්‍රියාත්මක වන දින සිට මේ පනත යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව මේ පනත යටතේ සාදනු ලබන නියෝග හෝ රීති මගින් සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය;

(ඉ) ඉවත් කළ පනත් යටතේ නිකුත් කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වන දිනයේ දී බලාත්මකව පවතින සෑම බලපත්‍රයක්ම හෝ ලියාපදිංචි කිරීමක්ම ක්‍රියාත්මක වන දින සිට මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමක් ලෙස සලකනු ලැබිය හැකි ය;

(ඊ) ඉවත් කළ පනත්වල විධිවිධාන යටතේ බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමක් සඳහා කරන ලද සෑම ඉල්ලීමක් ම, ක්‍රියාත්මක වන දින සිට මේ පනත යටතේ කරන

ලද ඉල්ලීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව කටයුතු කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**35**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"සුනඛයන් සඳහා වන අභිජනන මධ්‍යස්ථානය" යන්නෙන්, පුද්ගලික වාසස්ථානයක් ඇතුළුව, විකිණීම සඳහා සුනඛයන් අභිජනනය කිරීමේ ව්‍යාපාරයක් සිදු කරගෙන යනු ලබන යම් පරිශ්‍රයක් අදහස් වේ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ 2 වන වගන්තියේ සඳහන් කරනු ලබන සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නට, (469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"දිස්ත්‍රික් ලේකම්වරයා" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයකට අදාළව, ආණ්ඩුව විසින් එම පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරයා අදහස් වේ;

"නිර්වින්දන මරණය" යන්නෙන්, සත්වයාට අවම වේදනාවක් සහ බලපෑමක් ඇතිව ඉක්මන් සහ අප්‍රතිවර්ත්‍ය සිහිය නැතිවීමකට හේතු වන ක්‍රමයක් භාවිතයෙන් මරණයට පත් කිරීමේ ක්‍රියාව අදහස් වේ;

"රජයේ පශු වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ලියාපදිංචි කරන ලද සහ අදාළ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාවන් තුළ කාර්ය කිරීම සඳහා ආණ්ඩුව විසින් පත් කරනු ලැබූ පශු වෛද්‍යවරයකු අදහස් වේ;

"පශු සම්පත් සඳහා ඇති කරන සත්ත්වයා" යන්නෙන්, ආහාර සඳහා හෝ ආහාර නිෂ්පාදනය කිරීම සඳහා ඇති කරන ගවයා, (මී හරකා සහ කුළු හරකා), බැටළුවා, ඌරා, එළුවා සහ අශ්වයා ඇතුළු යම් ගෘහාශ්‍රිත හෝ හීලෑ කළ ක්ෂීරපායි සතකු අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද යම් අධිකාරියක් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පළාත් පාලන සහ පළාත් සභා විෂයය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නිරෝධායනය" යන්නෙන්, යම් සතකු හෝ යම් භාණ්ඩයක් අනිවාර්ය හුදකලා කොට රඳවා තබා ගැනීම අදහස් වේ;

"ලියාපදිංචි කිරීම" යන්නෙන්, යම් සුනඛයකු තබා ගන්නා හෝ එම සුනඛයා සිටින පරිපාලන සීමාවන් තුළ වූ පළාත් පාලන ආයතනයේ එම සුනඛයා ලියාපදිංචි කිරීම අදහස් වන අතර "ලියාපදිංචි කළ" යන පදය ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"සැක සහිත" යන්නෙන්, ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බවට සැක කරනු ලබන බව අදහස් වන අතර "සැක සහිත සත්ත්වයා" යන්නට, යම් රෝගී හෝ සැක සහිත සුනඛයකු සපා කනු ලැබූ හෝ එවැනි සුනඛයකු සමඟ සම්බන්ධ වූ හෝ ජලභීතිකා රෝග ආසාදනයට නිරාවරණය වූ යම් සතකු ඇතුළත් වේ;

"එන්නත් කිරීම" යන්නෙන්, පැටවකු සම්බන්ධයෙන් වන විට දී, වයස සති දොළහකින් පසුව ලබා දිය යුතු ජලභීතිකා රෝගය ආසාදනය වීම වැළැක්වීම සඳහා වන ප්‍රාථමික එන්නත ලබා දීම සහ ප්‍රාථමික එන්නත ලබා දීමෙන් සති හයක කාලසීමාවකට ඉක්බිතිව ම ලබා දිය යුතු අනුපූරක එන්නත ලබා දීම වන අතර වැඩිහිටි සුනඛයකු සම්බන්ධයෙන් වන විට දී, ජලභීතිකා රෝගය ආසාදනය වීම වැළැක්වීම සඳහා ලබා දුන් අවසාන එන්නත ලබා දීමේ දින සිට මාස දොළහක කාලසීමාවක් ගත වීමට පෙර අනුපූරක එන්නත ලබා දීම අදහස් වේ;

"පශු වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ලියාපදිංචි වූ සහ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාවන් තුළ කාර්ය පවරනු ලැබ ඇති පශු වෛද්‍යවරයකු අදහස් වේ;

“වන සතා” යන්නට, (469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 11 වන වගන්තියේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**36**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.